# පාසල් අධ්‍යාපනයේ උන්නතියට ජාතික අධ්‍යාපන ආයතනයේ මෙහෙවර

March 17, 2026 1:55 am




**පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව (PGDEM) ආයතනික ක්‍රමයට ද පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව (DSM) දූරස්ථ ක්‍රමයට ද හඳුන්වා දෙමින් සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරුවන් සංවර්ධනය සඳහා ද ජා.අ.ආ. ඉටු කර ඇත්තේ මහඟු සේවයකි.**

1985 අංක 28 දරන පාලරීමේන්තු පනතින් බිහි වූ ජාතික අධ්‍යාපන ආයතනය (National Institute of Education), සාමාන්‍ය අධ්‍යාපනය (General Education) යනුවෙන් හැඳින්වෙන අප රටේ පාසල් අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා ලබා දී ඇත්තේ සුළුපටු දායකත්වයක් නොවේ. එහෙත් පසුකාලීනව මුහුණදීමට සිදු වූ යම් යම් තත්ත්ව හමුවේ එම ආයතනය පසුබෑමට ලක් ව ඇති බවක් අද පෙනෙන්නට තිබෙන නිසා ජාතික අධ්‍යාපන ආයතනය ආරම්භ වූ ආකාරයත් ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනයේ උන්නතිය සඳහා එම ආයතනය කටයුතු කර ඇති ආකාරයත් පාඨක ඔබට පෙන්වා දීම අරමුණු කර මෙම ලිපිය සකස් කර තිබේ.

ජා. අ. ආ වූ කලී අධ්‍යාපන අමාත්‍යාංශය (Ministry of Education) යටතේ ශාස්ත්‍රීය කටයුතුවල නිරතව සිටි විවිධ සංවිධාන එක් වහලක් යටට ගෙන එමින් අසූව දශකය මැද භාගයේ දී පිහිටුවන ලද සංස්ථාපිත දේහයකි (corporate body). මෙසේ ජා.අ.ආ. යටතට පැමිණි විවිධ සංවිධාන අතර විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය (Curriculum Development Centre), ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන ආයතනය (Sri Lanka Staff College for Educational Administration) හා ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා උසස් ආයතනය (Higher Institute for English Education) හැරුණු විට පශ්චාත් උපාධි ගුරු අධ්‍යාපනය, දූරස්ථ ගුරු අධ්‍යාපනය, සෞන්දර්ය අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය මෙන් ම අධ්‍යාපන පර්යේෂණ, ඇගයීම් හා මාධ්‍ය වැනි ක්ෂේත්‍ර සඳහා පිහිටුවා තිබූ විවිධ ඒකක ද එවකට අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ගොඩනැඟෙමින් පැවති

පුස්තකාල සේවාව ද වැදගත් තැනක් ගනියි. රාජ්‍ය ආයතනයක දැඩි නීති රීති හමුවේ ජා.අ.ආ.ට පැවරෙන ශාස්ත්‍රීය වගකීම් සාර්ථකව ඉටු කිරීමේ දුෂ්කරතාව හඳුනා ගෙන සිටි එම ආයතනයේ නිර්මාතෘවරුන් නව ආයතනය සංස්ථාවක් ලෙස පිහිටුවීමට එදා කටයුතු කළේ ස්වකීය භූමිකාව සාර්ථකව ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ නිදහස ආයතනයට ලබා දීම සඳහායි.

ඉහත විස්තරය අපට පෙන්වා දෙන්නේ වඩා කාර්යක්ෂම වූ ද ඵලදායී වූ ද සේවයක් පාසල් අධ්‍යාපනයට ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවති ශාස්ත්‍රීය වගකීම්, පරිපාලන වගකීම්වලින් වෙන් කර ජා.අ.ආ ට පවරා තිබෙන බවයි. මේ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, සාමාන්‍ය අධ්‍යාපනයේ පරිපාලන බාහුව ලෙසත් ජා.අ.ආ. ශාස්ත්‍රීය බාහුව ලෙසත් ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර මේ ආයතන දෙක එකිනෙකා සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කටයුතු කරනු ඇතැයි යන්න මෙම ප්‍රතිසංස්කරණය හඳුන්වා දීමට දායක වූ සියලුදෙනාගේ අපේක්ෂාව විය.

මේ කාලය වන විට මහරගම ගුරු විද්‍යාලය ප්‍රමුඛ ගුරු විද්‍යාල ජාලයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති නිසාත් කැපී පෙනෙන දස්කම් සහිත ගුරු පරපුරක් බිහි කිරීමට එම ආයතන සමත් ව සිටි නිසාත් ආරම්භක ගුරු සංවර්ධන (Initial Teacher Development) අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම උපාධිධාරීන් නොවන ගුරුවරුන්ට එදා ගැටලුවක් වූයේ නැත. එහෙත් එම ගුරු සංවර්ධන අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා උපාධිධාරී ගුරුවරුන් හැදෑරිය යුතු වූ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ඒ වන විට කොළඹ හා පේරාදෙණිය විශ්වවිද්‍යාල පමණක් ක්‍රියාත්මක කළ නිසාත් එම පාඨ-මාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීමට ගුරු සේවයේ වසර පහක කාලයක් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වූ අතර ඉන් අනතුරුව අතිශයින් ම තරගකාරී වූ විභාගයකින් සමත් වන්නට ද සිදු වීම නිසාත් විශ්‍රාම යන තුරු ම මේ අවස්ථාව ලබා ගැනීමට නොහැකි වූ විශාල ගුරු පිරිසක් පද්ධතියේ සිටීම උපාධිධාරී ගුරුවරුන්ට එදා ඇති කර තිබුණේ ප්‍රබල අභියෝගයකි. මේ හැරුණු විට යල් පැන යන දැනුම් හා කුසලතා යාවත්කාලීන කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය අඛණ්ඩ ගුරු සංවර්ධන (Continuing Teacher Development) අවස්ථා ප්‍රමා-ණවත් පරිදි ලබා ගැනීම, ආරම්භක ගුරු සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කර සිටි උපාධිධාරී නොවන ගුරුව-රුන්ට මෙන් ම උපාධිධාරී ගුරුවරුන්ට ද ඇති කර තිබුණේ ගැටලුකාරී තත්ත්වයකි.

පහත දක්වා ඇත්තේ ජා.අ.ආ. පනත විස්තර කරන පරිදි ජා.අ.ආ. පිහිටුවීම සඳහා හේතු වූ කාරණා කිහිප-යකි. මේ කාරණා අතර මේ වන විටත් මා හඳුන්වා දී ඇති ගුරු සංවර්ධනය ආශ්‍රිත යෝජනා ද තිබීම මනා තත්ත්ව විශ්ලේෂණයක ප්‍රතිඵලයක් ලෙස ජා.අ.ආ බිහිව ඇති බව තේරුම් ගැනීම පාඨක ඔබට අපහසු නොකරයි.

අධ්‍යාපනයේ ශාස්ත්‍රීය වගකීම් අතර දුවර්ල තත්ත්වයක පැවති පහත සඳහන් කාර්ය වෙත සුවිශේෂ අව-ධානය යොමු කිරීම

- විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ ගුරු වෘත්තියට පිවිසෙන උපාධිධාරී ගුරුවරුන්ගේ ආරම්භක ගුරු සංවර්ධන අවශ්‍යතා සාක්ෂාත්කරණය,
- උක්ත ගුරු සංවර්ධන අවශ්‍යතාව සාක්ෂාත් කර තිබෙන උපාධිධාරී හා උපාධිධාරී නොවන ගුරුව-රුන්ගේ මෙන් ම පාසල් අධ්‍යාපනය සඳහා දායක වන ගුරු උපදේශක, විදුහල්පති, අධ්‍යාපන නිලධාරි වැනි තනතුරුලාභීන්ගේ ද වෘත්තීය කුසලතා ඔප්නංවමින් ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා කැපවීම,

පහත දැක්වෙන කාර්යයන්හි නිරත වෙමින් ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනය සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම්, වැඩසටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යවරයා දැනුවත් කිරීම,

- අධ්‍යාපන පද්ධතියේ ඉලක්ක, ව්‍යුහය, අන්තර්ගතය, ක්‍රමවිද්‍යාව හා කාර්ය සාධනය පිළිබඳවත් අධ්‍යාපනය ආශ්‍රිත සමාජ, ආර්ථික හා වෙනත් තත්ත්ව පිළිබඳවත් අධ්‍යයන දියත් කිරීම
- අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගැනීම වැනි නවීකරණ, අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දෙමින් ඒවා අඛණ්ඩව වැඩිදියුණු කිරීම.

ඉහත සඳහන් කාරණා අතර පාසල් අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා වහා ඉටු කළ යුතු ගුරු සංවර්ධනය වැනි කාර්ය මෙන් ම අධ්‍යාපන අමාත්‍යවරයා දැනුවත් කිරීමෙන් අනතුරුව පසුකාලීනව ඉටු කර ගත යුතු කාර්ය ද තිබීම පාසල් අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා ජා.අ.ආ. පනත ලබා දී තිබෙන පිටිවහල සනාථ කරයි.

ශ්‍රී ලාංකේය පාසල් පද්ධතියේ උන්නතිය සඳහා විෂයමාලා සංවර්ධනය, කළමනාකරණ සංවර්ධනය, ඉංග්‍රීසි අධ්‍යාපනය සංවර්ධනය වැනි වෙනත් කාරණා ද අතිශයින් ම වැදගත් වුවත් එම අංග මඟහැර ගුරු සංවර්ධනය, අධ්‍යාපනික පර්යේෂණ හා නවීකරණ පමණක් ඉලක්ක කර ජා.අ.ආ. පනත සකස් කරන්නට ඇත්තේ මන්ද යන්න මේ වන විට ඔබට ප්‍රශ්නයක් විය හැකියි. පාසල් විෂයමාලා සකස් කිරීම සඳහා වෙන් වූ විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයක්, අධ්‍යාපන පරිපාලන කටයුතුවල නියැළෙන විදුහල්පතිවරුන්, අධ්‍යාපන නිලධාරීන් වැනි පිරිස් සංවර්ධනය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන ආයතනයක් මෙන් ම ඉංග්‍රීසි අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා උසස් ආයතනයක් ද ඒ වන විටත් අප රටේ තිබීම පමණක් නොව එම ආයතන සාර්ථක මට්ටමින් ක්‍රියාත්මක වෙමින් ද පැවතීම එම ක්ෂේත්‍ර වෙනුවෙන් නවීකරණ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් එදා ප්‍රතිපත්ති සම්පාදකයන්ට ඇති නොකරන්නට ඇත. මේ හැරුණු විට සාමාන්‍ය අධ්‍යාපනයෙන් පරිබාහිර උසස් අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර වෙත අනවශ්‍ය පරිදි නැඹුරු වනු වෙනුවට පාසල් අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය සියලු තත්ත්ව සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා ම ගොඩනඟා ගැනීම වඩා ඵලදායි බව ඔවුන්ට අවබෝධ වී තිබෙන්නට ඇත.

ජා.අ.ආ. ආරම්භ කළ මුල් කාලයේ සිට ම එම ආයතනය උත්සාහ දැරුවේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ එවකට පැවති විවිධ හිදැස් හඳුනාගෙන, ඒවා පියවීම සඳහා කටයුතු කිරීමටයි. විශ්වවිද්‍යාල පමණක් ක්‍රියාත්මක කරමින් සිටි පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව දුරස්ථ මාධ්‍යයෙන් ඉදිරිපත් කරමින් කිසි ම වෘත්තීය සුදුසුකමක් නොමැතිව විශ්‍රාම යන තුරු ම සේවය කිරීමට සිදු ව තිබූ විශාල උපාධිධාරී ගුරු පිරිසක් එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ජා.අ.ආ. සමත් වීම මේ යටතේ ප්‍රධාන තැනක් ගනීයි. මේ හැරුණු විට ගුරුවිද්‍යාල ලබා දෙමින් සිටි පුහුණු ගුරු සහතිකය (Trained Teachers Certificate) දුරස්ථ මාධ්‍යයෙන් ඉදිරිපත් කරමින් උපාධිධාරීන් නොවන විශාල ගුරු පිරිසකට ද ආරම්භක ගුරු සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ඉඩ සැලසීම, පූර්ව සේවා ගුරු සංවර්ධන වැඩසටහන් (Pre-Service Teacher Development Programmes) සැලසුම් කර එම වැඩසටහන් ක්‍රියාවට නැඟීම සඳහා අධ්‍යාපන විද්‍යාපීඨවලට (Colleges of Education) මඟපෙන්වීම හා අඛණ්ඩ ගුරු සංවර්ධන වැඩසටහන් (Continuing Teacher Development Programmes) ඉදිරිපත් කිරීම සඳහා ගුරු මධ්‍යස්ථානවල සේවය කරන ගුරු අධ්‍යාපනඥයින් සූදානම් කිරීම ගුරු පාශර්වයෙන් ජා.අ.ආ. ඉටු කර තිබෙන වෙනත් වැදගත් සේවා කිහිපයකි.

පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව (PGDEM) ආයතනික ක්‍රමයට ද පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව (DSM) දුරස්ථ ක්‍රමයට ද හඳුන්වා දෙමින් සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරුවන්

සංවර්ධනය සඳහා ද ජා.අ.ආ. ඉටු කර ඇත්තේ මහඟු සේවයකි. විදුහල්පතිවරුන්ගේ සංවර්ධනය සඳහා මූලික හා උසස් විදුහල්පතිත්ව පාඨමාලා (Basic and Advanced Principalship Programmes) හඳුන්වා දීමෙන් අනතුරුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු ම කළමනාකරුවන්ගේ කළමනාකරණ හැකියා සංවර්ධනය සඳහා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ මූලික උපාධි මෙන් ම ශාස්ත්‍රපති උපාධි ද ජා.අ.ආ. හඳුන්වා දී තිබේ. විශ්වවිද්‍යාල හරහා ජා.අ.ආ. ගුරු අධ්‍යාපනය පිළිබඳ අත්දැකීම් ලබා ගත්ත ද කළමනාකරණ අධ්‍යා-පනය පිළිබඳ අත්දැකීම් විශ්වවිද්‍යාලවලට ලබා දීම සඳහා පවා ජා.අ.ආ.ට පෙරමුණ ගත හැකි වූයේ මා මේ වන විටත් සඳහන් කර තිබෙන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන ආයතනය ඔස්සේ ජා.අ.ආ. ලද ආභාසය නිසා ම බව කිව යුතු වෙයි.

නව සහශ්‍රකය අරඹන අවස්ථාවේ දී ඉදිරියට පැමිණෙමින් සිටි **පරිණාමන ගුරු භූමිකාව (Transformation Role of the Teacher)** වෙත ගුරුවරුන් ගෙන ඒම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centred), නිපුණතා පාදක (Competency Based), ක්‍රියාකාරකම් අභිමුඛ (Activity Oriented) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම, විෂයබද්ධ **දෘඪ කුසලතා** (Hard Skills) පමණක් අවධාරණය කරමින් සිටි අධ්‍යාපන ක්‍රියාවලියට, විෂයමාලාවේ සියලු ම විෂයයන්ට පොදු **මෘදු කුසලතා** (Soft Skills) එක් කරමින් එම කුසලතා සංවර්ධනය කළ හැකි ආකාර පෙන්වා දීම, **තක්සේරු ක්‍රමපිළිවෙත්** ඉදිරිපත් කරමින්, ආරම්භයේ සිට ම අප රටේ ක්‍රියාත්මක වූ ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් හමුවේ පද්ධතිය මුහුණදෙමින් සිටි විවිධ දුවර්ලතා ජය ගැනීම සඳහා **පාසල් පාදක ඇගයීම්** (school-based evaluations) හා **සුතත්‍ය ඇගයීම්** (authentic evaluations) හඳුන්වා දීම පමණක් නොව පෙර පාසල් අධ්‍යාපනය, ගුරු අධ්‍යාපනය, කළමනාකරණ අධ්‍යාපනය, මිනුම් හා ඇගයුම්, මාගෙර්ාපදේශය හා උපදේශනය, විශේෂ අධ්‍යාපනය, අන්තකර්රණ අධ්‍යාපනය, සාම අධ්‍යාපනය, කායර්මූල පයෙර්ෂණ වැනි වෙනත් වැදගත් විෂය රාශියක් වෙත සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන ගුරු හා කළමනාකරණ පිරිස්වල අවධානය අවශ්‍ය පරිදි යොමු කිරීම ද විශේෂ වැදගත්කමක් ගත් බව ද කිව යුතු ය.

ගුරු හා කළමනාකරණ පිරිස්වල සංවර්ධනය ඉලක්ක කර ජා.අ.ආ. හඳුන්වා දෙන ලද ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රවලට අමතරව පාසල් වයසේ දරුවන්ගේ ශුභසිද්ධිය සඳහා එම ආයතනය ඉදිරිපත් කර ඇති නව විෂය සංඛ්‍යාව ද සුළුපටු නොවේ. ආරම්භක විද්‍යාව, පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්, වාචික ඉංග්‍රීසි, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, නාට්‍ය හා රංග කලාව, දෙවන ජාතික භාෂාව (සිංහල හා දෙමළ), පොදු සෞන්දයර්, ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය, ව්‍යවසායකත්ව අධ්‍යයනය, අරාබි සාහිත්‍ය හා රසාස්වාදය, තොරතුරු තාක්ෂණය, මාධ්‍ය අධ්‍යයනය, මෙන් ම දෘඪ හා මෘදු තාක්ෂණය යටතට වැටෙන ඉන්ජිනේරු තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, යාන්ත්‍රික තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජලජ ජීව සම්පත් තාක්ෂණය, ආහාර තාක්ෂණය වැනි තාක්ෂණික විෂයයන් ද මේ අතර විශේෂ වැදගත්කමක් ගනියි.

විෂය ආශ්‍රිත ඉහත සඳහන් වෙනස්කම් හැරුණ විට ජා.අ.ආ. මුල් කාලයේ දී පවත්වා ගෙන ගිය පුස්තකාලය අග්නිදිග ආසියාවේ විශිෂ්ටතම පුස්තකාල සේවාව ලෙස පිළිගැනීමට ලක් වූ අතර අධ්‍යාපන හිණිමගේ ඉහළට ම යාම සඳහා අප රටේ සියලු ම දක්ෂ දරුවන්ට අවස්ථාව සලසා දුන් ආචායර් සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා සිහිපත් කිරීම සඳහා වසර 35ක කාලයක් තුළ ජා.අ.ආ.යේ පයෙර්ෂණ හා සංවර්ධන දෙපාතර්මේන්තුව පවත්වා ගෙන යමින් සිටින **කන්නන්ගර අනුස්මරණ දේශනය** ද අන්තර් ජාතික අවධානයට ලක් ව තිබෙන අධ්‍යාපන මාධ්‍ය අංශය හා විවෘත පාසල ආශ්‍රිත නිර්මාණ ද ආයතනයේ කීතර්ිනාමය ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබා දී තිබේ. මේ හැරුණ විට 90 දශකය අග භාගයේ දී කලඑළියට ආ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණයේ සාථර්කතා මට්ටම් හඳුනාගැනීම සඳහා

පයෙර්ෂණ හා සංවධර්න දෙපාතර්මේන්තුව දියත් කළ අන්වායාම පයෙර්ෂණය (longitudinal research) ද බොහෝ දෙනාගේ පැසසුමට ලක් වූයේ අප රටේ බහුතරයකගේ මව් බස වන සිංහල භාෂාව නිවැරදිව හැසිරවීම තහවුරු කිරීම සඳහා එම දෙපාතර්මේන්තුව ම හඳුන්වා දෙන ලද **සිංහල ලේඛන රීතිය** ද සමගයි. අමතර වශයෙන් ජා.අ.ආ.යේ විවිධ දෙපාතර්මේන්තු සම්පාදනය කර තිබෙන විවිධ ජනර්ල අතර පයෙර්ෂණ හා සංවධර්න දෙපාතර්මේන්තුව ආරම්භ කර පවත්වා ගෙන යන අධ්‍යාපන පයෙර්ෂණ පිළිබඳ සාකර් ජනර්ලය හා ශ්‍රී ලාංකීය ජනර්ලය මෙන් ම අධ්‍යාපනික පිරිස්හි වෘත්තීය සංවධර්නය පිළිබඳ වගකීම් පැවරී තිබෙන මධ්‍යස්ථාන අධර් වාෂරීකව ඉදිරිපත් කරමින් සිටි අධ්‍යාපන කළමනා හා ගුරු අධ්‍යාපන ජනර්ල ද වැදගත් තැනක් ගනීයි.

*ආචායර් ඉන්දිරා ලිලාමණී ගිනිගේ*

*ජාතික අධ්‍යාපන ආයතනයේ*

*හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරියක්*